# 15

# 'සදා මෙලෙස පුර දෙරණේ'

සිංහලය ස්වාධීන භාෂාවක් සේ වර්ධනය වීම හා සමගාමී ව සිංහල කවිය ද වර්ධනය වූ බව දැනට ඉතිරි වී ඇති පැරණි ම සිංහල කාව්‍ය නිර්මාණවලින් පැහැදිලි වෙයි. සිංහල භාෂාවෙන් ලියැවුණු පැරණි ම සිංහල කාව්‍ය නිර්මාණ අපට හමු වන්නේ සීගිරියේ කැටපත් පවුරිනි. ඉන් පසු ව ලියැවුණු සිංහල කවි පොත් රාශියකින් කිහිපයක් ආරක්ෂා වී පරපුරෙන් පරපුරට පැවත එමින් සිංහල කාව්‍ය ඉතිහාසය දීප්තිමත් කරයි. කව්සිළුමිණ, සැළලිහිණි සන්දේශය, ගුත්තිලය, සුභාෂිතය, ලෝකෝපකාරය ඒ අතරින් කිහිපයකි. අපේ පැරණි කවි පොත් දෙකකින් උපුටා ගත් කවි කිහිපයක් මේ පාඩමේ දැක්වේ.

## කාව්‍යශේඛරය

තොටගමුවේ ශ්‍රී රාහුල හිමිපාණන් විසින් රචනා කරන ලද මහා කාව්‍ය කෘතියකි. කෝට්ටේ රාජධානි සමයට අයත් මෙම කාව්‍ය ග්‍රන්ථය සඳහා පාදක වී ඇත්තේ පන්සිය පනස් ජාතක පොතෙහි එන සත්තුභත්ත ජාතකය යි. පහත දැක්වෙන්නේ කාව්‍යශේඛරයේ තුන් වන සර්ගයේ එන කවි කිහිපයකි.

1. දත් කැකුළු පෑ ලා
සුරතල් සිනා සී ලා
බොළඳ බස් දී ලා
කෙළී සියලඟ දූලි ගා ලා

2. කඳ කුමරිඳු ලෙසි න
බමුණු පැටියන් සමගි න
නොමඳ සව් ඉසුරෙ න
වැඩිණි නව සඳ මෙන් දිනෙන් දින

3. ඉඟුරු දුරු ඇ යුතු
මල්ගොමු හා වවා වතු
ගව මී තමා නතු
දසුන පිළිවිස බලව ඇති තතු

4. ඉරු ගිලෙන දව සේ
ගහණ ද පොහෝ දව සේ
සඳ සිකුරු දව සේ
ගොමින් පිරිබඩ ගනුව නිව සේ

5. නිති ගේ දොර ඇමද
කැලි කසල දැක නොම ඉඳ
උදාසන සවසද
පහන් දල්වව විමන නො වරද

## අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| සියලඟ | - | සර්වාංගයෙහි/ ඇඟ පුරා ම |
| දූලි | - | දූවිලි |
| කඳ කුමරිඳු | - | ස්කන්ධ කුමාර/ කතරගම දෙවියා |
| බමුණු පැටියන් | - | බ්‍රාහ්මණ කුමාරයන් |
| නොමඳ | - | අප්‍රමාණ |
| සව් ඉසුරෙන | - | සකල ආශ්චර්යයෙන්, සියලු සැප සම්පතින් |
| නව සඳ | - | අමාවකට පසු දා අහසේ පායන සඳ |
| දුරු | - | දුරු වර්ග (සූදුරු/ මහදුරු ආදී) |
| ඇ යුතු | - | ආදිය සහිත |
| තමා නතු | - | තමන් සන්තක |
| පිළිවිස | - | විමසා |
| පිරිබඩ | - | පිළිසකර කර |
| විමන | - | නිවසේ |
| ගහණ | - | ග්‍රහණය (සූර්ය ග්‍රහණය/ චන්ද්‍ර ග්‍රහණය) |

## ගුත්තිල කාව්‍යය

ගුත්තිල කාව්‍යය වෑත්තෑවේ හිමිපාණන් විසින් රචනා කරන ලද කෘතියකි. මෙය ද කෝට්ටේ අවදියට අයත් කෘතියකි. ගුත්තිල කාව්‍යය සඳහා පාදක වී ඇත්තේ පන්සියපනස් ජාතක පොතේ එන ගුත්තිල ජාතකය යි. ගුත්තිල කාව්‍යයේ එන '**උදේනි පුර සැණකෙළිය**' නමැති කොටසෙන් පහත දැක්වෙන කවි උපුටා ගෙන ඇත.

1. සදවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹතුරු
තබවා පුන්කුඹු විසිතුරු

2. උදා දිනිඳු කර හරණේ
විදා අඳුරු දිසි කිරණේ
යොදා දෙපස රන් තොරණේ
සදා මෙලෙස පුර දෙරණේ

### අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| පිවිතුරු | - | පවිත්‍ර වූ |
| රන් දද | - | රත්තරන් කොඩි |
| රඹතුරු | - | කෙසෙල් ගස් |
| පුන්කුඹු | - | පුන්කලස් |
| දිනිඳු | - | සූර්යයා |
| දෙපස | - | දෙපැත්තේ |
| පුර | - | නගර |

### අවබෝධය

1. කාව්‍යශේඛරයේ දැක්වෙන කුමරු, කුඩා දරුවකු ලෙස නිරූපණය කළ හැසිරීම් දෙකක් ලියන්න.
2. කාව්‍යශේඛරයෙන් උපුටා ගෙන ඇති දෙවන කවියේ එන උපමා දෙකක් ලියන්න.

3. කවි පෙළෙහි දක්වා ඇත්තේ පවිත්‍ර නිවසක තිබිය යුතු කවර දේ ද?
4. ගුත්තිල කාව්‍යයේ සඳහන් පරිදි සෑම නිවසක් පාසා ම තබා ඇත්තේ මොනවා ද?
5. උදේනි පුරය සැණකෙළි සිරියක් ගත් බවට නිදසුන් දෙකක් උපුටා දක්වන්න.

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් පදවලට සමානාර්ථ පද ලියන්න.

   i. නොමඳ -
   ii. නිති -
   iii. පිවිතුරු -
   iv. පුන්කුඹු -
   v. දිනිඳු -

2. පාඩමේ එන කවිවලින් උපුටා ගෙන ඇති පහත සඳහන් පදවල අර්ථ පැහැදිලි කරන්න.

   i. බොළඳ බස් -
   ii. දසුන -
   iii. මල්ගොමු -
   iv. පිවිතුරු -
   v. පියකරු -

3. පාඩමේ ඇතුළත් කවිවල අර්ථ ලියන්න.
4. මෙම පාඩමෙන් ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ දෙකක් නම් කරන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. 'ඔබ උදේනි පුර සැණකෙළිය' නැරඹුවා යැයි සලකා පන්තිය ඉදිරියේ කථාවක් කරන්න.
2. 'කාව්‍යශේඛරයෙන් ජීවිතයට ගත හැකි ආදර්ශ' මැයෙන් කථාවක් කරන්න.
3. ඔබ දුටු සැණකෙළියක් පිළිබඳ කවි කිහිපයක් හෝ රචනයක් ලියන්න.